වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
**Department of Trade and Investment Policy**

මහලේකම් කාර්යාලය,කොළඹ - 01
செயலகம்,கொழும்பு - 01
The Secretariat, Colombo - 01

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதார மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
Ministry of Finance, Economic and Policy Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — TIP/TP/01/34(2) | ඔබේ අංකය / உமது இல / Your No. — | දිනය / திகதி / Date — 2020.01.13 |

රජයේ මුද්‍රණාලයාධිපති
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මියණි

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය**

කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා විසින් 2020 ජනවාරි මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලබන 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය 2020 **ජනවාරි 13** දිනැති අංක **2158/1** දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 525 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බැවින් මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**කේ. ඒ. විමලේන්තිරරාජා**
**අධ්‍යක්ෂ ජනරාල්**

o/c

පිටපත් - 1. රේගු අධ්‍යක්ෂ ජනරාල් , මේ සමග එවනු ලබන 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා

2. ලේකම්, කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා

3. අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා

දුරකථන අංකය / தொலைபேசி / Telephone — 0112 484 888 | ෆැක්ස් / தொலைநகல் / Fax — 0112 484 830 | විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail — admin@tipd.treasury.gov.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Website — www.treasury.gov.lk

## රජයේ නිවේදන

### 1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

### 14 වැනි වගන්තිය යටතේ නියෝග

කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩයට අනුරූපව 2017 නොවැම්බර් මස 27 දිනැති අංක 2047/2 දරන *අති විශේෂ* ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනයෙහි IV වන තීරුවෙහි දක්වා ඇති සෙස් බදු ප්‍රමාණය 2020 ජනවාරි මස 14 වැනි දින සිට බලපැවැත්වෙන ලෙස අවලංගු කරනු ලබන බව ප්‍රකාශ කරමි.

ප්‍රසන්න රණතුංග
කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය

2020 ජනවාරි මස ...13... වන දින
කොළඹ - 01
කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

| සං.ව.ශීර්ෂය<br>I | සං.ව.සංකේතය<br>II | | විස්තරය<br>III | සෙස් බදු ප්‍රමාණය<br>IV |
|---|---|---|---|---|
| 11.01 | 1101.00 | | තිරිඟු හෝ මෙස්ලින් පිටි | |
| | 1101.00.10 | --- | තිරිඟු වලින් | කි.ග්‍රෑමයට රු.15.00 |